**විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**
**ශ්‍රේණිය - 10 ශ්‍රේණිය**

## පූර්ව ප්‍රවේශ ක්‍රියාකාරකම් හා පසු ඇගයීම් ක්‍රියාකාරකම්

**නිපුණතාව 9 : - තොරතුරු ලබා ගැනීම සඳහා සරල දත්ත සමුදා නිර්මාණය**
නිපුණතා මට්ටම 9.1 : - දත්ත සමුදා සංකල්ප ගවේෂණය කරයි.

**ශිෂ්‍ය කාර්යය-**


1) වර්තමානයේ විවිධ වර්ගයේ දත්ත ගබඩා කර ඇති ස්ථාන කිහිපයක් හඳුනාගෙන ලැයිස්තුවක් සකස් කරන්න.උදා-ශිෂ්‍ය පැමිණීමේ ලේඛන,බැංකු ගිණුම් දත්ත

2) ඉහත හඳුනා ගත් දත්ත ගබඩා වල සුවිශේෂී ගුණාංග හඳුනා ගැනීමට උත්සාහ කරන්න.

3) 10 ශ්‍රේණිය තොරතුරු තාක්ෂණ පෙළ පොතෙහි පිටු අංක 263-271 දක්වා අවබෝධයෙන් කියවා තේරුම් ගන්න.

4) පහත රූපසටහන අධ්‍යයනය කර සම්බන්ධිත දත්ත සමුදාය පිළිබඳ අවබෝධය ලබා ගන්න.

තනි වස්තුවකට හෝ පුද්ගලයෙකුට හෝ අදාළ දත්ත ඇතුළත් ක්ෂේත්‍ර සමූහයක් රෙකෝඩයක් ලෙස හැඳින්වෙයි. රෙකෝඩවල එකතුවක් දත්ත වගුවක් ලෙස හැඳින්වෙයි. එකිනෙක සම්බන්ධිත වගු එකතුවක් සම්බන්ධිත දත්ත සමුදායක් ලෙස හැඳින්වෙයි.




| ලියාපදිංචි අංකය | නම | උපන් දිනය | භාරකරුගේ නම |
|---|---|---|---|
| 100 | මනෝජ් දයාරත්න | 2/9/2008 | ජී. දයාරත්න |
| 101 | ෆිරෝසා රෆීක් | 4/2/2008 | කේ. ෆායිස් |

| ලියාපදිංචි අංකය | පොතේ අංකය | ලබා ගත් දිනය | භාර දිය යුතු දිනය |
|---|---|---|---|
| 101 | 2222 | 2/9/2014 | 16/9/2014 |
| 100 | 3333 | 3/9/2014 | 17/9/2014 |
| 101 | 1111 | 3/9/2014 | 17/9/2014 |
| 100 | 3333 | 4/9/2014 | 18/9/2014 |

5) 10 ශ්‍රේණිය තොරතුරු තාක්ෂණ පෙළ පොතෙහි පිටු අංක 272-276 දක්වා කියවා දත්ත සමුදායක යතුරු වර්ග හඳුනා ගන්න.

6) මෙම පාඩම ආශ්‍රිත ගැටලු සඳහා ගුරුභවතුන්ගෙන් හා යහලුවන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබා ගන්න .

**<u>මෙම පාඩමට අදාළව උපකාර කර ගත හැකි ඉගෙනුම් ආධාරක</u>**

- e-නැණපියස -
  Course: 10 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (enenapiyasa.lk)
- ගුරු ගෙදර - https://youtu.be/hfbU3-GtRKs

**<u>මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල</u>**

- දත්ත සමුදායක ස්වභාවය හා වාසි සාකච්ඡා කරයි.
- සම්බන්ධිත දත්ත සමුදායක ලක්ෂණ පැහැදිලි කරයි.

**<u>ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය</u>**

1) දත්ත සමුදායක ලක්ෂණ 5 ක් ලියා දක්වන්න .

2) ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායක වාසි 5 ක් ලියා දක්වන්න .

3) පහත වගු ඇසුරින් පිළිතුරු සපයන්න .

පහත ප්‍රශ්න පහත දත්ත සමුදාය මත පදනම් වී ඇත.දී ඇති වගු මගින් පොත් සාප්පුවක විකිණීමට ඇති පොත්වල හා පොත් ප්‍රකාශකයන්ගේ දත්ත පෙන්වනු ලබයි.

| Book වගුව | | | |
|---|---|---|---|
| Book_ID | Book_Name | Quantity | Unit_Price |
| B001 | Exploring Moon | 5 | 250 |
| B002 | Wonders of the World | 20 | 200 |
| B003 | Art of Magic | 50 | 150 |
| B004 | Red Rackan's Treasure | 20 | 300 |

| book_Publisher වගුව | |
|---|---|
| Book_ID | Publisher_ID |
| B001 | P003 |
| B002 | P002 |
| B003 | P002 |
| B004 | P001 |

| Publisher වගුව | | |
|---|---|---|
| Publisher_ID | Publisher_Name | Publ_Phone |
| P001 | Williansons | 5566778 |
| P002 | Bertram Publishers | 2345678 |
| P003 | Siena anda Sieana | 2356987 |
| P004 | United Books | 5587698 |

a) Book වගුවේ ක්ෂේත්‍ර ගණන කීයද ?ඒවායේ නම් ලියන්න .

b) Book වගුවේ රෙකෝඩ ගණන කීයද ?

c) Book වගුවේ ප්‍රාථමික යතුර සඳහා යෝග්‍ය කුමක්ද?

d) ආගන්තුක යතුරක් හෝ යතුරු වගුව සමඟ ලියා දක්වන්න .